
ලංකාවිත්ති
LANKA VITHTHI

LANKA VITHTHI
P.O.BOX 14373
LONDON NW6 3WU
ENGLAND

*Phone & Fax* : **020 7428 9388**
E-mail : **lanka.viththi @ virgin.net**

කර්තෘ : දයා ආනන්ද රණසිංහ
***Editor*** : **Daya Ananda Ranasinghe**

චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
***Art*** : Chandana Seneviratna
පරිගණක කටයුතු : චන්න කබ්රාල්
***Computer Graphics*** : Channa Cabraal
ඡායාරූප : ආනන්ද කාරියවසම්
***Photography*** : Ananda Kariyawasam



## අපේ ග්‍රාමාරක්ෂක හමුදාව ගැනයි

**ප**සුගිය සතියේ ලන්ඩනයේ දී මට ශ්‍රීලංකාවේ සිවිල් ආරක්ෂක අමාත්‍යංශයේ අතිරේක අධ්‍යක්ෂක ජෙනරාල් නන්දන විජේරත්න මහතා හමු විය. නන්දන, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයෙකු ද වෙයි. පළපුරුදු, කාර්යක්ෂම නිලධාරියෙකු වන ඔහුගෙන් ශ්‍රී ලංකාවේ වර්තමාන ආරක්ෂක තත්වය පිළිබඳව බොහෝ කරුණු හා සැබෑ තොරතුරු රැසක් දැනගන්නට ලැබිණ. එසේ ම ඔහු තමා යටතේ පවතින සිවිල් ආරක්ෂක භට හමුදාව ගැන ද විස්තර කළේ ය.

මීට පෙර ග්‍රාමාරක්ෂකයින් ලෙස හඳුන්වනු ලැබූ ශ්‍රීලංකාවේ උතුරු නැගෙණහිර අනාරක්ෂිතවූත්, එසේම කොටි ත්‍රස්තවාදී තර්ජනයට ලක්වූත් ගම්වල ආරක්ෂාව සඳහා යොදවා ඇති සිවිල් ආරක්ෂක භට හමුදාවේ දැනට නිරත සංඛ්‍යාව 42,000 කි. මේ භටයින් තෝරාගෙන ඇත්තේ ඒ ගම්වල ජීවත්වන තරුණ පෙළ අතරිනි. ඔවුන්ට ආරක්ෂක කටයුතු සඳහාත්, නවීනතම ගිනි අවි ආයුධ පරිහරණය පිළිබඳවත් නිත්‍ය බලකායේ අන්දමටම පුහුණුව ලබා දී ඇත. එසේ ම ඔවුන්ට හොඳ වැටුපක් ද ලැබේ. මේ සිවිල් ආරක්ෂක භටයින් ගැන ඉතා කෙටි හැඳින්වීමේ සටහනකි.

මේ භටයින් මුලින්ම ආරක්ෂක පථයට ඇතුල් වූ හැටි මට සිහිවෙයි. ඒ මෙසේ ය.

1983 දී ද්‍රවිඩ කොටි ත්‍රස්තවාදය ආරම්භ වී මාස කීපයක් ඇතුළතම කොටි ත්‍රස්තවාදීහු වව්නියාවේ ඩොලර්ෆාම් සහ කෙන්ට්ෆාම් නම් ගොවිපළවලට ද, නායාරු හා කෝකිලායි නම් ධීවර ගම්මාන දෙකට ද කඩා වැදී එහි සිටි සිංහල වැසියන් 73 දෙනෙකු රාත්‍රියේ කපා කොටා ඝාතනය කළෝ ය. ඊට මාස කීපයකට පසු අනුරාධපුර ශ්‍රී මහා බෝධිය අසල සිංහල සැදැහැවතුන් 146 දෙනෙකු වෙඩිතබා මැරූහ. මේ අයුරින් මාසකට දෙතුන් වතාවක් ගම්වල ට පැන සිංහල වැසියන් මරා දැමීම කොටින් අතින් සිදුවෙද්දී ශ්‍රීලංකාවේ උතුරු නැගෙණහිර ආරක්ෂක තත්වය බිංදුවටම බැස්සේය. කොටි ත්‍රස්තයින්ගේ අභිප්‍රායවූයේ සිංහළ ගම්වැසියන් ඝාතනය කිරීමෙන් එම ගම්වලින් සිංහළයින් පන්නා හැර ඒ ගම් අත්පත්කරගැනීමයි. සැබැවින්ම සමහර ගම් දමා සිංහළයින් පලාගොස් තිබුණි. ඒවා ආරක්ෂාකරන්නට කෙනෙකු නොවීය.

සමහර ගම් වැසියෝ කාගෙන් හෝ ඉල්ලා ගෙන ආ හේන්වල සතුන්ට වෙඩිතබන තුවක්කු කොටයක් අතැතිව ගහකට නැග එළිවෙන තුරා ඇහැ ඇරගෙන කොටින්ගෙන් ගම ආරක්ෂා කළෝය. කාන්තාවන් ද කුඩා දරුවන් ද රැයේ ගෙයි නොසිට කොටින්ට බියෙන් පඳුරු අස්සේ සැඟවී සිට උදේ එළිය වැටුණු විට ගෙට ආ වාර ද අනන්තය. අන්ත දුක් විඳගෙන ඒ මිනිසුන් ජීවිතය ගැටගසාගනිමින් එහිම සිටියා මිස තම ගම් දමා ගියේ නැත.

ග්‍රාම ආරක්ෂාවට වෙනම ගැමියන් කණ්ඩායමක් පුහුණු කර යෙදවීමේ අවශ්‍යතාව රජයට දැනුණි. අද උතුරු නැගෙණහිර ආරක්ෂාවට යොදා ඇති සිවිල්ආරක්ෂක භටකාය එහි ප්‍රතිපලයකි. ඒනිසාම පසුගිය කාලයේ කොටින්ට පෙර මෙන් ගම්වැසියන් මරාදැමීමට හැකිවුණේ නැත. එහි ගෞරවය නිසැකවම හිමිවිය යුතු වන්නේ එම සිවිල් ආරක්ෂක ග්‍රාමීය භට සේනාංකයට ය.



England rugby hero Jonny Wilkinson with his longer hair and more relaxed attitude playing for the Newcastle Falcons last weekend

# England rugby star Jonny Wilkinson embraces Buddhism

We should have known that Jonny Wilkinson had a spiritual side from the way he clasps his hands as if in prayer before he kicks for goal.

Now the England rugby star has revealed that he has found inner peace through Buddhism.

Wilkinson, 29, who became a national hero in the **2003 World Cup**, said the religion had helped him overcome a fear of failure which was ruining his life.

His obsessive perfectionism had been making him miserable but Buddhism had liberated him from being motivated by 'money, status, or ego'.

The millionaire sportsman said that within 24 hours of winning the World Cup final against Australia in Sydney, he felt a powerful feeling of anticlimax.

" I did not know what it really meant to be happy. I was afflicted by a powerful fear of failure and did not know how to free myself from it."

Soon afterwards his career was derailed by injuries which put him out of the international game for four years.

To distract himself he tried learning the guitar, the piano, French and Spanish.

In the end he had a '**Eureka**' moment while reading a book on quantum physics - the study of sub-atomic particles.

" **Quantum physics** helped me to realise that I was creating this destructive reality and that all I needed to do to change it was to change the way I chose to perceive the world," he told the Times.

" I do not like religious labels, but there is a connection between quantum physics and Buddhism, which I was also getting into."

" Failing at something is one thing, but Buddhism tells us that it is up to us how we interpret that failure. **The Middle Way** in Buddhism is also about having the right intentions."

**( Courtesy - UK Times)**

# රගර් ශූරයා විල්කින්සන් බෞද්ධයෙක් වෙයි

**එ**ංගලන්තයේ ජාතික රගර් කණ්ඩායමේ රගර් ශූරයෙකු ලෙස ජනාදරයට පත් ජොනී විල්කින්සන් මේ නොබෝදා ප්‍රකාශ කළේ බුදු දහම තුළින් ඔහු ජීවිතයට නව අර්ථයක් සපයාගත් බවයි. 2003 වසරේදී පැවති රගර් ලෝක ශූරතාවේ අවසාන මහා තරඟයට එංගලන්ත පිළ ඕස්ට්‍රේලියාවට එහි සිඩ්නි නගරයේදී මුහුණ දුන් අවස්ථාවේ විල්කින්සන්ගේ පහරින් ලත් ගෝලයෙන් එංගලන්තයට දිනුම අත්විය. ඉන් ජොනි විල්කින්සන් එක රැයින් එංගලන්තයේ වීරයා බවට පත්වුණි. එහෙත් ඔහු කිසියම් අවිනිශ්චිත බයකින් හා සැකයෙන් පෙලෙන්නට වීය. ක්‍රීඩාව කෙරෙහි තමා තුළ ඇති විශ්වාසයද නැතිවන්නට වීය. කොන්ටම් භෞතික විද්‍යාව ගැන පොතක් කියවද්දී එය බුදුදහමට ඉතා සම්බන්ධ බව ඔහු දැනගත්තේය. බුදු දහම තවත් දුර පිළිබඳව සොයාබැලීමේදී බිය හා සැක කෙනෙකුගේ සිතෙහි හටගන්නා සෘණ සිතුවිලි දාමයන් බව ද ඔහුට වැටහිණ. තමා දැන් ඒ සැකයෙන් බියෙන් තොරව ඉතා හොඳින් ජීවිතයේ සියළු අංශයන් සකසාගෙන ඇති බව පවසන ජොනී විල්කින්සන් බුදු දහමේ මැද පිළිවෙත යමක් හරි චේතනාවෙන් යුතුව කරන්නට යොමු කරන දහමක් බවද කියයි.

## ✻ නව සහශ්‍රයට ධර්මානුශාසනා ✻

### හිතොපදේශයෙන්

කෝර්ථාන් ප්‍රාප්‍ය න ගර්විතො විෂයිණ:
කස්‍යාපදොස්තං ගතා :
ස්ත්‍රීභිර් කස්‍ය න ඛන්ඩිතං භුවි මන:
කොවාස්ති රාඥාං ප්‍රිය:
ක කාලස්‍ය භූජාන්තරං න ච ගත:
කෝර්ථී ගතො ගෞරවං
කො වා දුර්ජනවාගුරාසු පතිත:
ක්ෂෙමෙණ යාත: ප්‍රමාන්

***අර්ථය*** : ලෝකයේ ධනයට පැමිණ අහංකාර නොවූයේ කව්රුද? කම් සැප විඳින කවරෙකුගේ විපත්තීහු අවසන් වූවාහුද? කවරෙකුගේ සිත ස්ත්‍රීන් විසින් නොකඩන ලද්දේද? රජුට ප්‍රිය වූ කවරෙක් නම් වෙත්ද? කවරෙක් නම් මාරයාගේ බාහු අතරට නොගියේද? ඉල්ලන සුළු වූ කවරෙක් ගෞරවයට ගියේද? දුර්ජනයින්ගේ කපටි දැල්හි වැටුණාහු කවර නම් මිනිසෙක් යහතින් ගියේද?

**ධ**නයම මාන්නය කරගන්නා තැනැත්තාගේ ස්වභාවය මෙම පද්‍යයේ පළමු කාරණය ලෙස සඳහන් කර ඇත. ධනය සෑම කෙනෙකුගේම ලෞකික ජීවිතය සාර්ථක කරගැනීම සඳහා අවශ්‍ය දෙයකි. කෙනෙකුට වාසනා මහිමයෙන් ද, කෙනෙකුට පරම්පරාවෙන් උරුමවීමෙන්ද, කෙනෙකුට තම උත්සාහයෙන් උපයාගන්නා ධාර්මික ධනය තිබිය හැකිය. ඒ අතර තවත් කෙනෙකු කූට උපක්‍රම, නොපනත්කම් හා දූෂණයෙන්, වංචා හොරමැරකම් වලින් අධාර්මිකව උපයාගන්නා ධනයද ඇත. එම ධනය ධාර්මිකව ඉපයූ ධනයෙන් දහසින් එකක්වත් වටින්නේ නැත. ධනය කෙනෙකුගේ සදාකාලික උරුමය නොවන නිසා එය හේතුකොටගෙන උඩඟුකම ආරෝපණය කරගැනීම මෝඩකමකි. ධනය තණ්හාවෙන් ගොඩගසාගන්නා දෙයක් නොව එළඹෙන අවශ්‍යතාවන් වෙනුවෙන් වැය කළයුතු දෙයකි.

දෙවැන්න කම් සැප විඳින්නන්ගේ විපත්තීන්හි අඩුවක් නොවන බවයි. කම්සැප විඳීමට ගිජුවූවහුගේ ඒ කෙරෙහි ඇදී යාමේ සීමාවක් නැත. අසීමිත ලෙස පසිඳුරන් පිනවීමට ඇබ්බැහි වූවහුගේ විපත්තීන් දිනෙන් දින ඉහළ යනු මිස පහළයාමක් නැත. අධික ලෙස කම්සැපෙහි ලොල්වූවහු වත්පොහොසත්කම් වලින් පිරිහීම පමණක් නොව සමාජ මට්ටමින් පහළට වැටීම, පවුලේ ස්ථාවරය බිඳවැටීම ආදී සියල්ලක්ම ඔහු කරා එන්නේය.

මෙහි තෙවැනි කරුණ නම් සෑම පුරුෂයෙකුගේම සිත ස්ත්‍රියක විසින් කඩා තිබීමයි. කතුවරයා මෙයින් අදහස්කරන්නට ඇත්තේ සෑම ස්ත්‍රියක විසින්ම පුරුෂයින්ගේ බලාපොරොත්තු කඩකරනු ලැබ ඇති බව හෝ ස්ත්‍රියකගේ ග්‍රහණයට හසු නොවූ එකදු පිරිමියෙකු හෝ නැති බව විය හැකියි.

රජ කෙනෙකුට ප්‍රිය වූ කිසිම කෙනෙකු නොමැති බව සිව්වෙනි කරුණයි. මින් අදහස්කරන්නේ පාලකයින් කිසිම කෙනෙකු සර්ව සාධාරණ ලෙස පාලන තන්ත්‍රය පවත්වාගෙන නොයන බවයි. පාලනයට පත්වන සෑම රාජ්‍ය නායකයෙකුම තම සිතැඟියාවන්ට අනුව පාලනය කිරීමට යාමෙන් රාජ්‍ය සම්මතයත් සමාජ සම්මතයත් කඩකිරීම නිසා අසාධාරණ සිදුවීමෙන් සියළු දෙනාගේ අප්‍රසාදයට හා අවමානයට ලක්වන බවයි. අනෙක් අතට රජෙකුට සියළු දෙනාම සතුටු කිරීමත් අසීරු කටයුත්තකි. එයට හේතුව සමාජය භින්නරුචික වීමයි. එසේම පාලනය වන ජනතාවගේ පොදු එසේම විවිධ අවශ්‍යතා රජු විසින් අවබෝධ කරගනු නොලැබීම ද තවත් හේතුවකි.

මාරයාගේ අත් අතරට නොගිය කෙනෙකු නැත යන්න ඊළඟ අදහසයි. එනම් සියල්ලන්ම කෙදිනක හෝ කොයි ආකාරයකින් හෝ මරු තුරුලට යන බවයි. එය ලොකු කුඩා දුප්පත් පෝසත් හොඳ නරක ආදී භේදයකින් තොරව සිදුවන්නකි.

අනුන්ගෙන් ඉල්ලන්නෙකු කිසිදිනක ගෞරවයට පත්නොවන බව ඊළඟ අදහසයි. තම ශක්ති ප්‍රමාණය අනුව අනුන්ගෙන් නොයිල්ලා ගෞරවාන්විතව ජීවත්වීම මින් අදහස් කෙරේ.

අවසන් කරුණ නම් දුදනන්ගේ කපටි දැල්වලට හසුවී යහතින් ගැලවී ගිය කෙනෙකු නැති බවයි. දුදනන් එම දැල් මනාව සැළසුම්කර එලන බැවින් බොහෝ දෙන ඊට අසුවන්නේ නිරායාසයෙනි. එසේ රැවටිල්ලට හසුවන බොහෝදෙන තමා අසුවූ බව දැනගන්නේ ද අසුවූවාට පසුවය. එනිසා රැවටිලිකාර, බොරු වර්ණනා කරන, ප්‍රයෝගකාරී, වංචනිකයන්ගෙන් ප්‍රවේශම් වන්න!



♦ ***පූජ්‍ය විල්ඹය විමලජෝති හිමි***
**ලන්ඩන් බෞද්ධ විහාරය**
**London Buddhist Viharaya**

**ANOOMA & HEGODA**
**Solicitors**
**2 Queens Parade**
**Green Lanes, London N8 0RD**
**Tel. 020 8348 7772**
**Colombo Office**
**Visa Refusals**
**Property Purchase in Sri Lanka**
**Hegoda & Hegoda**
**100/6 Rosemead Place**
**Colombo 7**
**Tel. 2672432 / 0777686632**